# ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

# කොළඹ දිසා වැඩසටහන් මණ්ඩලය

PRESIDENT'S SCOUT

## ජනාධිපති බාලදක්ෂ ප්‍රදානය

### විෂය නිර්දේශය සඳහා අවශ්‍යතාවයන්

COLOMBO DISTRICT PROGRAMME TEAM

"YOUTH EMPOWERMENT"

2023 .03.30

1. **බාලදක්ෂ පොරොන්දුව හා බාලදක්ෂ නීතිය 3**

   - බාලදක්ෂ පොරොන්දුවෙහි හෝ බාලදක්ෂ නීතියෙහි එක කොටසක් පදනම් කරගෙන ක්‍රීඩා/අභියෝග /රඟපෑම් (නාට්‍යයක්) ඉදිරිපත් කිරීම.
   - බාලදක්ෂ නීතියෙහි කොටස් දෙකක් පදනම් කරගෙන බාලදක්ෂ කණ්ඩායමට කථාවක් පැවැත්වීම

## බාලදක්ෂ පොරොන්දුව



මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටුකිරීමට ද ,

සැම කල්හිම අනුන්ට උපකාර කිරීමට ද ,

බාලදක්ෂ නීතියට කීකරු වීමටද ,

මාගේ අවංක විශ්වාසය උඩ සම්පූර්ණ උත්සාහය දීමට

ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි.

## බාලදක්ෂ නීතිය

1. බාලදක්ෂයා විශ්වාස කටයුතු අයෙකි.
2. බාලදක්ෂයා පක්ෂපාතී අයෙකි.
3. බාලදක්ෂයා හිතෛෂී කාරුණික අයෙකි.
4. බාලදක්ෂයා සැම බාලදක්ෂයෙකුගේම සහෝදරයෙකි.
5. බාලදක්ෂයා ධෛර්යය සම්පන්න අයෙකි.
6. බාලදක්ෂයා සත්ව කරුණාව ඇති අයෙකි.
7. බාලදක්ෂයා සහයෝගයෙන් ක්‍රියා කරන්නෙකි.
8. බාලදක්ෂයා සොම්නස් සහගත අයෙකි.
9. බාලදක්ෂයා සකසුරුවම් අයෙකි.
10. බාලදක්ෂයා සිත, කය, වචනයෙන් පිරිසිදු අයෙකි.

**2. ලොග් පොත - 2**

ජනාධිපති බාලදක්ෂ ප්‍රදනයෙහි සියලු අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව දිසා කොමසාරිස් වරයා විසින් බාලදක්ෂයා සම්මුඛ පරීක්ෂණයකට ලක්කළ යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී බාලදක්ෂයා විසින් සිය ලොග් පොත දිසා කොමසාරිස් වරයා වෙත ඉදිරිපත් කළ යුතුවේ. සම්මුඛ පරීක්ෂණයට පෙර අවම වශයෙන් අවුරුදු 02 මාස 06 ක් ආවරණය වන පරිදි මෙම ලොග් පොතෙහි වාර්තා අඩංගු විය යුතු වේ.මෙම වාර්තා තුළ බාලදක්ෂයෙකු වශයෙන් ඔහුගේ/ඇයගේ අත්දැකීම්, සහභාගී වූ කඳවුරු ,දෛනික කණ්ඩායම් රැස්වීම් ආදියෙහි කළ දේ යනාදිය ඇතුළත් විය යුතුය.

**3 . කලා හා විනෝදාංශ කුසලතා**

කලාත්මක හෝ සාහිත්‍ය මය අංශයක නිර්මාණයක් කිරීම.

නිදසුන්- පින්තාරු කිරීම , මූර්තියක්, කවි පංතියක්, සිංදුවක්,නාට්‍යයක්, කථික තරඟයකට කතාවක්,ඓතිහාසික හෝ සංස්කෘතික වටිනා කමක් ඇති ස්ථානයක් පිලිබඳ සමීක්ෂණ වර්ථාවක් , කතන්දරයක්(මෙම නිර්මාණය අදාළ බාලදක්ෂ්යාගේ බවට බාලදක්ෂ නායකයා සෑහීමකට පත් විය යුතුය)

**4. බාලදක්ෂ ශිල්පය**

බාලදක්ෂයෙකුට හෝ කණ්ඩායමකට බාලදක්ෂ ප්‍රදානය හා ප්‍රධාන කොමසාරිස් ප්‍රදානය සඳහා නියමිත බාලදක්ෂ ශිල්පීය දක්ෂතා 3 ක් බාලදක්ෂ නායකගේ අවසරය මත පුහුණු කිරීම.

## 5. පුරෝගාමී ව්‍යාපෘතිය

පුරෝගාමී ව්‍යාපෘතියක් සංවිධානය කිරීමේ නායකත්වය දැරීම. ( පාලම් ,නිරීක්ෂණ කුළුණු ,තුරුමත කුටි,කාලීන උපකරණ , පිවිසුම් දොරටු සංකීර්ණ, ඔන්චිල්ල, සීසෝ, කඳවුරු මුළුතැන්ගෙය, ගබඩා කාමරය ආදිය ඉදිකිරීම )





















## 6 . හදිස්සි අවස්ථාවකදී / ස්වභාවික විපතකදී නායකත්වය දැරීම

හදිස්සි අවස්ථාවකදී ,ස්වභාවික විපතකදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව තමා තුළ ඇති දැනුම හා අවබෝධය පිළිබඳව බාලදක්ෂ නායක සමග සාකච්ඡා කිරීම (ප්‍රථමාධාර දීම ඇතුළුව)

හදිසි කළමනාකරණයේ මූලික ප්‍රශ්නවලින් එකක් වන්නේ නායකත්වයයි. අර්බුදකාරී අවස්ථාවන්හිදී නායකත්වය වඩාත් වැදගත් වන්නේ නායකයා මහජනතාවට වඩාත් දෘශ්‍යමාන වන අතර ජීවිත හා දේපළ අවදානමට ලක්විය හැකි බැවින් පීඩනය යටතේ පවා ඵලදායී ලෙස ක්‍රියා කිරීම නායකයෙකුට ඉතා වැදගත් වේ.



## හදිසි අවස්ථාවක නායකත්වය වැදගත් වන්නේ ඇයි?

නායකයෙකු කණ්ඩායමේ වගකීම භාර ගත යුතු අතර, අර්බුදකාරී ප්‍රතිචාරයේ කණ්ඩායම් හිමිකාරිත්වයට සහාය විය යුතු අතර, නුසුදුසු බාහිර මැදිහත්වීම් වලින් කණ්ඩායම ආරක්ෂා කළ යුතුය. සමස්තයක් වශයෙන් කණ්ඩායමට සාර්ථකත්වය සඳහා පිළිගැනීමක් ලැබෙන බව සහතික කිරීම නායකයාට වැදගත් වේ.

## අර්බුදයකදී හොඳම නායකත්වය කුමක්ද?

අර්බුදකාරී අවස්ථාවන්හිදී වඩාත් ඵලදායී නායකයින් කිහිප දෙනෙකු විසින් **පරිවර්තනීය නායකත්වය** භාවිතා කර ඇත. මෙය නායකත්ව විලාසයකි, එහිදී නායකයා සිදුවිය යුතු වෙනස වටහාගෙන, සංවිධානාත්මක දැක්ම මෙහෙයවන අතර, මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සමානව කැපවී සිටින කණ්ඩායමක් භාවිතා කරයි.



## අර්බුද කළමනාකරණයේදී නායකත්වය වැදගත් වන්නේ ඇයි?

හොඳ නායකයින් අර්බුදයක් සඳහා කල්තියාම සැලසුම් කර ඇත, එබැවින් ඔවුන් කළ යුතු දේ දන්නා අතර එය සැබෑ ලෝකයේ ඇති වුවහොත් එය ඉක්මනින් කළ හැකිය. මෙය කලබල වීමට හා සැලැස්මෙන් වැළකී සිටීමට කාලය නොවේ. ඒ වෙනුවට, සියලුම පද්ධති ක්‍රියාත්මක වීමට ඔබේ නායකත්ව කුසලතා භාවිතා කරන්න

## අර්බුදයකදී වැදගත් වන නායකත්වයේ ලක්ෂණ මොනවාද?

මෙම සාමාන්‍ය ගුණාංගවලින් ඔබ්බට, එලදායි අර්බුද නායකත්වය සඳහා මූලික වශයෙන් සමීක්ෂණ සඳහා ප්‍රතිචාර දැක්වූවන් හඳුනාගෙන ඇති කුසලතා සහ ගුණාංග 08 ක් පහත දැක්වේ

- හොඳ සම්බන්ධීකාරක යෙකු වීම
- නිවැරදි ඉක්මන් තීරණ ගැනීම
- අත්දැකීමක්
- ඉලක්කක් කරා ගමන් කිරීම
- ශක්තිමත් සන්නිවේදකයා
- හැකි පහසුකම් සපයන්නා
- හදිසි නොවී ඉතා සන්සුන්ව කටයුතු කිරීම
- හොඳ සවන්දෙන්නෙක් වීම






**7. සෞඛ්‍ය පුරුදු**


බාලදක්ෂ ප්‍රදානය සඳහා ඉදිරිපත් වන බාලදක්ෂයෙකුට පෞද්ගලික සෞඛ්‍ය පුරුදු පිළිබඳව බාලදක්ෂ නායකයාගේ අවසරය මත පුහුණු කරවීම



## 8. තොරතුරු තාක්ෂණික දැනුම - 4

- පරිඝණක යතුරු පුවරුවක් උපයෝගී කරගෙන බාලදක්ෂයාගේ භාෂාව නොවන වෙනත් භාෂාවකින් දෛනික ජීවිතයේදී වැදගත් වන වචන 15 ක් අක්ෂරකරණය කිරීමට ඉගෙන ගැනීම.
- විනාඩි 5 ක් තුළ ඉදිරි පත් කිරීම සඳහා පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් සකස් කිරීම.

| **මාතෘකාව** | **පරිඝණක පිටු (Slides) ප්‍රමාණය** |
|---|---|
| බාලදක්ෂ පොරොන්දුව හා බාලදක්ෂ නිතිය | 02 |
| බාලදක්ෂ ව්‍යාපාරයේ නිර්මාතෘ | 03 |
| බාලදක්ෂ ව්‍යාපාරයේ අභිප්‍රාය හා මෙහෙවර | 02 |
| ලෝක බාලදක්ෂ සංවිධානය හා කලාප | 03 |
| ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයේ ඉතිහාසය | 04 |
| බාලදක්ෂයාගේ අධ්‍යාපන ජයග්‍රහණ ඇතුලත් තම ගැන විස්තර | 03 |
| බාලදක්ෂයාගේ කණ්ඩායම / සමූහය | 01 |
| බාලදක්ෂයාගේ බාලදක්ෂ ජීවිතය /ජයග්‍රහණ/සහභාගිත්වය/නායකත්වය | 05 |
| බාලදක්ෂයගේ අනාගත අරමුණු | 01 |
| **එකතුව** | **24** |



**9. සම්බධිකරණ භාෂා කුසලතා - 4**

ඕනෑම මාතෘකාවක් පිළිබඳ බාලදක්ෂයාගේ මව් භාෂාව නොවන වෙනත් භාෂාවකින් විනාඩි 03 ක කතාවක් පැවැත්වීම ( පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම මෙහිදී යොදා ගත හැකිය)




**10) හානියෙන් සුරක්ෂාව 11**

- අවදානම් තක්සේරු කිරීමේ මූලික ක්‍රම පිළිබඳව පැහැදිලි කිරීමේ හැකියාවක් තිබීම
- අයුතු බලපෑම් හෝ හිරිහැරයකට පත් වූ අයෙකුට උපකාර කරණ ආකාරය දැන සිටීම
- හදිසි ගිලන් රථ අංකය, හදිසි පොලිස් ඇමතුම් අංකය,ගිනි නිවීමේ සේවා අංකය,ළමා සහයක අංශ අංකය හා පොලිස් හදිසි කණ්ඩායම් අංකය දන සිටීම.
- පහත සඳහන් දේ පිළිබඳව දැනුම ප්‍රදර්ශනය කිරීම.
    - ➢ පාසැල් ගොඩනැගිල්ල තුළ ආරක්ෂාව
    - ➢ බාලදක්ෂ ක්‍රියාකාරකම් වලදී ආරක්ෂාව
    - ➢ ගින්නෙන් ආරක්ෂාව
    - ➢ ඔබගේ නිවස පිහිටා ඇති ප්‍රදේශයට අදාළ වන පරිදි කඳු,ගංගා හා කැලෑ ආදියේදී ආරක්ෂාව
- සෞඛ්‍ය සමපන්න ජීවිතයකට අදාළ නීති දන සිටීම.
- අවංකත්වය යන්න කුමක්ද යන්න හා එය දියුණු කරනු ලබන ආකාරය දැන ගැනීම.

අවදානම් තක්සේරුවේ මූලික කරුණු මොනවාද?

අවදානම් තක්සේරුවක් යනු කුමක්ද? අවදානම් තක්සේරුව යනු ඔබ කරන සමස්ත ක්‍රියාවලිය හෝ ක්‍රමය විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි: හානියක් සිදු කිරීමට හැකියාව ඇති උපද්‍රව සහ අවදානම් සාධක හඳුනා ගැනීම (උපද්‍රව හඳුනා ගැනීම). එම උපද්‍රවයට සම්බන්ධ අවදානම විශ්ලේෂණය කිරීම සහ ඇගයීම (අවදානම් විශ්ලේෂණය සහ අවදානම් ඇගයීම).

Table 1: Risk matrix



හිරිහැර වැළැක්වීමේ වැදගත්කම කුමක්ද?

කරුණාව, පිළිගැනීම සහ ඇතුළත් කිරීම වැනි ධනාත්මක ක්‍රියාවන් ප්‍රවර්ධනය කිරීම මෙන්ම හිරිහැර කිරීම වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. සමහර අවස්ථාවලදී, හිරිහැර කිරීම පාසැල් වෙඩි තැබීම් සහ සියදිවි නසාගැනීම් වැනි විනාශකාරී ප්‍රතිවිපාකවලට තුඩු දිය හැකිය. හිරිහැර කිරීම සාක්ෂිකරුවන්ට මෙන්ම ඉලක්කවලටද බලපායි.

නාඳුනන අය සමඟ කතා නොකරන්න



කිසිම නාඳුනන කෙනෙකු සමඟ කතා නොකරන ලෙස ඔබ වග බලාගත යුතුය. එවිට අපරාධකරුවන් විසින් ඔබව පැහැරගෙන යාමේ අවස්ථාව අඩු කරයි. තමන් හොඳින් හඳුනන අය ද මුල් තැනට එන්නේ නම් මිස ආගන්තුකයන්ට ළං නොවීමට සිහි තබා ගත යුතුය. තෑගි, මුදල් හෝ රසකැවිලි යනාදිය ලබා දෙමින් ඔබට අනවශ්‍ය ලෙස ළංවීමට දරන උත්සාහය පිළිබඳව අවධානයෙන් සිටිය යුතුය.

වැඩිහිටි අධීක්ෂණය සමඟ වීදිය තරණය කරන්න

වැඩිහිටි අධීක්ෂණය පවතින විට පමණක් පාර මාරුවීමට සිහි තබා ගත යුතුය. රතු එළිවලින් දුවන, මාර්ග නීති කඩ කළ හැකි හෝ අනතුරුදායක පාමාරුවල යෙදෙන වාහනවලින් ඔබ ආරක්ෂා කරයි. දරුවෙකුට තේරුම් ගැනීමට අපහසු වීමට පෙර දරුවාගේ ජීවිතයේ මුල් අවදියේදීම වීදි තරණය කිරීමේදී ආරක්ෂිත නීති උගන්වන්න

කිසි විටෙකත් ගින්න සමඟ සෙල්ලම් නොකරන්න



අවට ගින්නක් දකින විට ගින්නක් ඇති කරන කිසිදු වස්තුවකට අත නොතබන ලෙසත් . මෙම ආරක්ෂක නීති සමඟ ගිනි තත්වයන්ට මුහුණ දෙන විට කළ යුතු දේ දැන ගනු ඇත.

ගමනාගමනයේදී ළමයින් බොහෝ භයානක අවස්ථාවන්ට නිරාවරණය වන නිසා පාසලට යන විට සහ ආපසු එන විට ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වියයුතුය . වීදි තරණය කරන ආකාරය, මාර්ගයක් තරණය කිරීමට පෙර දෙපැත්ත බලන්න, බස් රථයක හෝ කාර් රථයක තිබිය යුතු ආරක්ෂක උපකරණ මොනවාද (උදා: ආසන පටි) සහ ගිනි, තුවාල, හෝ අනතුරු වැනි ආරක්ෂාවට හානි වූ විට ක්‍රියා කළ යුතු ආකාරය පිලිබඳ සිහි තබා ගත යුතුය.

**11 . බාධක සහිත ප ගමනක් සංවිධානය**

බාලදක්ෂ විද්‍යාව ග්‍රන්ථයේ සඳහන් වන මං සලකුණු භාවිත කරමින් බාලදක්ෂ නායකයාගේ අනුමැතිය, උපදෙස් හා අධීක්ෂණය සහිතව කණ්ඩායමක් හෝ බාලදක්ෂයින් දෙදෙනෙකු සඳහා තම කාණ්ඩයම පිහිටි ප්‍රදේශය තුළ උපරිම කි.මී. 1 ක් දුර පාගමනක් සංවිධානය කිරීම.



**12 . ප්‍රජා සේවා ව්‍යාපෘතිය**

- බාලදක්ෂයා විසින් උපරිම වශයෙන් බාලදක්ෂයින් 12 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සමගින් මිනිස් පය 72ක ප්‍රජ සේවා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම( මෙම මිනිස් පය 72 සඳහා දිව ආහාරය හා තේ පානය සඳහා වැය කරන පැයක කාලයද අඩංගු විය හැකිය)
- ව්‍යාපෘති යෝජනාව සඳහා දිසා කොමසාරිස් වරයාගේ හෝ ඔහු විසින් නම් කරන ලද සහකාර දිසා කොමසාරිස් වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.
- සැලසුම් කරණය හා ක්‍රියාත්මක කිරීම ආදිය මාසයක පමණ කාලයක් තුලදී සිදුකළ යුතුය.
- බාලදක්ෂයා විසන් දිසා කොමසාරිස් වරයාගේ හෝ ඔහු විසින් නම් කරන ලද සහකාර දිසා කොමසාරිස් වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.මෙම වාර්තාව තුළ අවසර ලිපි, ඡායාරූප,ඇගයීම් , ගිණුම් ආදිය ඇතුළත් වේ.
- ප්‍රාදේශීය හෝ වෙනත් ආයතන සමග එක්ව මෙම ව්‍යාපෘතිය සංවිධානය කිරීම සුදුසු වේ.

**<u>හෝ</u>**

විකල්ප වශයෙන් Better World Framework යටතේ එන ප්‍රවීණතා පදක්කම් අතුරින් " සාමයේ පණිවිඩ කරු" (Massenger of Peace ) පදක්කමට අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

සාමයේ පණිවිඩකරු ප්‍රවීණතා පදක්කමට අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීම මගින් ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයෙකු හට ජනාධිපති ප්‍රද්නයේ අංක 12 අවශ්‍යතාව සම්පූර්ණ වන අතර ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත " සාමයේ පණිවිඩ කරු" පදක්කම දින ගත හැකිය ( අදාළ විෂය නිර්දේශය ප්‍රවීණතා පදක්කම් නිර්ද්ශයේ ඇත)

**13 . කඳවුරු රාත්‍රී 4**

කාර්යක්ෂමතා ප්‍රසාදනය සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ සිට කඳවුරු රාත්‍රී 4ක් ගත කර තිබීම. ( මෙම රාත්‍රී 4 එක දිගට හෝ කඩින් කඩ විය හැකිය ) මේ පිළිබඳව ලොග් පොතේ සටහන් කළ යුතුය.



## <u>සේවා කාලය මාස 09 යි</u>

අග්‍රාමාත්‍ය බාලදක්ෂ ප්‍රධානය යටතේ කාර්යක්ෂමතා ප්‍රසාදනය සම්පූර්ණ කළ දින පටන් අවම වශයෙන් මාස 09 ක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය.

## <u>ප්‍රවීණතා පදක්කම්</u>

බාලදක්ෂයා විසින් පහත සඳහන් ප්‍රවීණතා පදක්කම් පහ (05) සමත් කළ යුතුය.

1. ජ්‍යෙෂ්ඨ පසන් නිවැසි ( සමත් කිරීම හෝ යළි සමත් කිරීම )
2. ගිලන් සේවා  ( සමත් කිරීම හෝ යළි සමත් කිරීම )
3. ගබඩා පාලක හෝ කඳවුරු පාලක ( සමත් කිරීම හෝ යළි සමත් කිරීම )
4. ජ්‍යෙෂ්ඨ සංවිධායක
5. මහාජන සේවා කාණ්ඩයේ බාලදක්ෂයා විසින් දැනට සමත් කර ඇති පදක්කම් වලට අමතරව එක් පදක්කමක්

**1. ජ්‍යෙෂ්ඨ පසන් නිවැසි**




**2. ගිලන් සේවා**




**3. ගබඩා පාලක හෝ කඳවුරු පාලක**







**4. ජ්‍යෙෂ්ඨ සංවිධායක**



5. **මහාජන සේවා කාණ්ඩයේ බාලදක්ෂයා විසින් දැනට සමත් කර ඇති පදක්කම් වලට අමතරව එක් පදක්කමක්**




- සියලුම පදක්කම් ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ අංශයෙන් තෝරා ගත යුතුය.
- ප්‍රජා සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරීමට පෙර සංවිධායක පදක්කම සමත් කළ යුතුය.
- ජනාධිපති පදක්කමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු බාලදක්ෂයා හට වෙනත් ඕනෑම ජ්‍යෙෂ්ඨ ප්‍රවීණතා පදක්කමක් සමත් කළ හැකිය.
- බාලදක්ෂ්යාට ජනාධිපති ප්‍රදානය දිනා ගත හැකි වන්නේ ඔහුට/ඇයට වයස අවුරුදු 16 සම්පූර්ණ වූ පසුව වන අතර, වයස අවුරුදු 18 න් පසු එය දින ගත නොහැකිය.
- බාලදක්ෂයා විසින් ජනාධිපති බාලදක්ෂ ප්‍රදානය සිය නිල ඇඳුමේ වම කමිස සාක්කුවට ඉහළ සේවා තරු වලට ඉහළින් පැළඳිය යුතුය.

**සටහන්** - වයස අවුරුදු 18 ඉක්මවීමට පෙර අයදුම්පත් යොමු කිරීම මගින් බාලදක්ෂයා හට කල්තියා අවශ්‍ය නිවරදි කිරීම් කර ගැනීමට අවකාශ ලැබේ. ඔහුගේ / ඇයගේ වයස ඉක්මවූ පසු කිසියම් දෝෂයක් හඳුනා ගැනීමෙන් පසු බාලදක්ෂයාගේ යහපත පිණිස ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය හට කිසිත් උපකාරයක් කළ නොහැකි වනු ඇත.

- **අවසන් අයදුම් පත පහත සඳහන් ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.**

  - ✓ ප්‍රජා සේවා ව්‍යාපෘති වාර්තාව
  - ✓ විදුහල්පති / අංශ ප්‍රධානී විසින් සහතිකකරණ ලද උපත් සහතිකයේ පිටපත
  - ✓ ප්‍රගති කාඩ් පත් දෙක / ප්‍රගති සටහන් පොත
  - ✓ ජාතික හැඳුනුම් පතේ සහතික කරන ලද පිටපත
  - ✓ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් ඉල්ලා සිටින වෙනත් ඕනෑම ලේඛනයක්

- ❖ **ආරම්භ කළ හැකි අවම වයස - අවුරුදු 15 මාස 03 සම්පූර්ණ වූ පසු හා කාර්යක්ෂමතා ප්‍රසාදනය හා අග්‍රාමාත්‍ය බාලදක්ෂ ප්‍රදානය දිනා ගැනීමෙන් පසු.**

- ❖ **දිනාගත හැකි අවම වයස - අවුරුදු 16**

- ❖ **අවම සේවා කාලය - මාස 09 යි**

- ❖ **වයස අවුරුදු 18 ට පෙර දිනා ගත යුතුය.**

- ❖ **අවසාන සම්මුඛ පරීක්ෂණය - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සහකාර ප්‍රධාන කොමසාරිස් (සංවර්ධන) සහ ඔහුගේ / ඇයගේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙහි සහය සහිතව ප්‍රධාන කොමසාරිස් වරයා විසින්.**

- ❖ **අවසාන අනුමැතිය - ප්‍රධාන කොමසාරිස් තුමා**

## ජනාධිපති බාලදක්ෂ ප්‍රදානය සඳහා

## ප්‍රජා සේවා ව්‍යාපෘති

ගෝලීය ප්‍රජාවේ පුරවැසියන් වශයෙන් බාලදක්ෂයන් විසන් සිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එක්සත් ජාතීන් විසින් ප්‍රකාශය පත්කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ ( Sustainable Development Goals / SDG s) කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසුවේ.

තිරසර සංවර්ධන අභිමතාර්ථ වලට (ති.ස.අ.) අදාළ ව්‍යාපෘති සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වා ඇත.

### යෝජිත් ව්‍යාපෘති

### ති.ස.අ. 1 - දුගී බව දුරලීම

- දුගී පවුලක් හෝ පුද්ගලයෙකු වෙනුවෙන් නිවසක් ඉදි කිරීම.

### ති.ස.අ. 2 - කුස ගිනිදුරලීම

- සරණාගත කඳවුරු ආදීයෙහි වියලි ආධාර බෙදා දීම ආදීය සංවිධානය කිරීම.

### ති.ස.අ. 3 - නිරෝගිමත් ජීවිතය

- පොදු සුසන භූමියක් පිරිසිදු කිරීම
- මහජන ක්‍රීඩාංගනයක / අසරණ සරණ නිවාසයක අලුත් වැඩියාවක් සිදු කිරීම.
- රෝහල් වාට්ටුවක් / වැඩිහිටි හෝ අසරණ සරණ නිවාසයක පිරිසිදු කිරීම හා පින්තාරු කිරීම.
- රජයේ දෙපාර්ත මෙන්තුවක් විසින් හෝ වෙනත් සංවිධානයක් විසින් ක්‍රියාත්මක කරන ඩෙංගු උවදුර දුරලීම වැනි ව්‍යාපෘතියකට සහය වීම.
- අඩු පහසුකම් ඇති පාසැල් වල සෞඛ්‍ය සායන ආදීය සංවිධානය කිරීම.
- වෙනත් සංවිධාන වල සහය සහිතව අක්ෂි සායන, ඇස් කන්නාඩි බෙදා දීම ආදීය සංවිධානය කිරීම.
- ලේ දන්දීමේ වැඩ සටහනක් සංවිධානය කිරීම්.
- මහජන සනිපාරක්ෂක ව්‍යාපෘති සංවිධානය කිරීම.

**ති.ස.අ. 4 - අධ්‍යාපනය**

- අඩු පහසුකම් සහිත පාසැල් වල පුස්තකාල පහසුකම් ආදිය සංවර්ධනය කිරීම.

**ති.ස.අ. 5 - ස්ත්‍රී පුරුෂ සමතාව**

- පිරිමි හා ගැහැණු ළමුන්ගේ සහභාගිත්වයෙන් සංස්කෘතික උත්සවයක් සංවිධානය කිරීම.

**ති.ස.අ. 6 - පවිත්‍ර ජලය**

- ග්‍රාමීය ළිං/පොකුණු ආදිය පවිත්‍ර කිරීම හෝ අලුත්වැඩියාව
- පොදු ජලනළ පහසුකම් වැනි පොදු පහසුකම් අලුත්වැඩියාව
- වන්දනා කරුවන් සඳහා අවශ්‍ය වන පිරිසිදු පානීය ජල පහසුකම් සැපයීම.

**ති.ස.අ. 7 - පවිත්‍ර බලශක්තිය**

- කුඩා පරිමාණයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතියක් සංවිධානය කිරීම.

**ති.ස.අ. 8 - ආර්ථික වර්ධනය**

- දුගී පවුලකට ආදායම් මාර්ගයක් සපයා ගත හැකි ආකාරයේ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියක් සංවිධානය කිරීම.

**ති.ස.අ. 9 - කර්මාන්ත සහ යටිතල පහසුකම්**

- වෙනත් ආයතන විසින් නොසලකා හරින ලද මාර්ග පිළිසකර කිරීම.

**ති.ස.අ. 10 - අසමානතාව දුරලීම**

- මහජන ක්‍රීඩාංගනයක හෝ අසරණ සරණ නිවාසයක අලුත් වැඩියාවක් සිදු කිරීම.

**ති.ස.අ. 11 - තිරසර භාවය**

- දුගී පවුලක් හෝ පුද්ගලයෙකු වෙනුවෙන් නිවසක් ඉදි කිරීම.

## ති.ස.අ. 12 - වගකීම් සහගත පරිභෝජය

- ❖ සම්පත් ,ආහාර ආදිය නාස්ති නොකිරීම පිලිබඳ මහජනාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම.

## ති.ස.අ. 13 - දේශගුණය රැක ගැනීම

- ❖ රුක් රෝපණ ව්‍යාපෘති සංවිධානය කිරීම.

## ති.ස.අ. 14 - ජලජ ජීවිතය

- ❖ වෙරළ ගඟා ඉවුරු ආදිය පිරිසිඳු කිරීමේ ව්‍යාපෘතියක් සංවිධානය කිරීම.

## ති.ස.අ. 15 - මිහිමත ජීවිතය

- ❖ රුක් රෝපණ ව්‍යාපෘති සංවිධානය කිරීම

## ති.ස.අ. 16 - සාමය සහ යුක්තිය

- ❖ විවිධ ජාතීන්ට අයත් ජනතාව සහභාගී කර ගනිමින් සංස්කෘතික හුවමාරු වැඩසටහනක් සංවිධානය කිරීම්.

## ති.ස.අ. 17 - හවුල්කාරීත්වය

- ❖ විවිධ රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතන වල සහභාගිත්වයෙන් ප්‍රජාවට සේවාවක් සැලසීම සඳහා සෞඛ්‍ය සායන , හැඳුනුම්පත් නිකුතුව, විවිධ උපයෝගිතා සේවා ආදිය සපයන සේවා කඳවුරු ආදිය සංවිධානය කිරීම.

- ඉහත සඳහන් උදාහරණ වලට අමතරව, බාලදක්ෂයාගේ ප්‍රදේශයට හා හැකියාවට ගැලපෙන පරිදි ව්‍යාපෘති තොර ගැනීමට බාලදක්ෂයාට හැකිය.කෙසේ වුවද තෝරා ගනු ලබන ව්‍යාපෘති යෝජනාව දිසා කොමසාරිස් වරයා විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් අනුමත කළ යුතුය.එමෙන්ම එම ව්‍යාපෘතිය හුදෙක් බාලදක්ෂයාගේ නිවසට අදාළ වන්නක් නොව සමස්තයක් වශයෙන් ගත්කල සමාජයේ යම් කොටසටකට උපකාරයක් වන ව්‍යාපෘතියක් විය යුතුය.ඉහත දැක්වෙන තරසර සංවර්ධන අරමුණු වලින් පරිබාහිර විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සහකාර ප්‍රධාන කොමසාරිස් (සංවර්ධන) ගේ එකඟතාව ලබා ගැනීම අවශ්‍ය වේ.

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මසකට පෙර පටන් වත් ව්‍යාපෘතිය සැලසුම් කිරීම ආරම්භ කළ යුතුය.ව්‍යාපෘතිය ආරම්භ වීමට පෙර පැවති තත්වය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරණ අවස්ථාවේදී,ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු තත්වය යන අවස්ථා වලට අදාළ ඡායාරූප අවම වශයෙන් 03ක් අවසාන වාර්තාව තුළ අඩංගු වියයුතුය.

- ව්‍යාපෘතිය අවසානයේදී පහත සඳහන් අන්තර්ගත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

## ව්‍යාපෘති යෝජනාවක ඇතුළත් වියයුතු කරුණු

1. අපේක්ෂකයාගේ නම්,ලිපිනය, බාලදක්ෂ සමූහය
2. මාතෘකාව ( කුමක් සඳහා සිදු කරන ව්‍යාපෘතියක් ද යන වග )
3. හැඳින්වීම
4. ගතවන කාලය හා අපේක්ෂිත දින
5. අරමුණු හා අභිමතාර්ථ
6. ව්‍යාපෘතිය සඳහා අවසර ලබා ගතයුතු අය.
7. ව්‍යාපෘතිය සඳහා සකස් කළ ලිපි පිටපත්
8. අවශ්‍යතා හා උපකරණ ලේඛනය
9. අවශ්‍ය මිනිස් ශ්‍රම ප්‍රමාණය හා ලබා ගැනීමට අපේක්ෂා කරන ක්‍රමය
10. ඇස්තමේන්තු ගත අයවැය ලේඛනය
11. ඒ සඳහා අවශ්‍ය මුදල් සොයා ගන්නා පිළිවෙළ
12. අවශ්‍ය සම්පත් සොයා ගන්නා පිළිවෙළ
13. ආහාර පාන හා සංග්‍රහ කටයුතු සූදානම් කරන ආකාරය.
14. මෙම ව්‍යාපෘතියට සම්බන්ධ කර ගත හැකි වෙනත් සංවිධාන හා ආයතන.
15. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආකාරය කෙටියෙන්.
16. ගැන්ට් කාල රාමුව
17. දිසා කොමසාරිස් / සහකාර දිසා කොමසාරිස් අනුමැතිය

## ගැන්ට් කාල රාමුව

| ක්‍රියාකාරකම | වගකීම | මාසය<br>දිනය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| A | | | | | | | | | | | | | |
| B | | | | | | | | | | | | | |
| C | | | | | | | | | | | | | |
| D | | | | | | | | | | | | | |
| E | | | | | | | | | | | | | |

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය වෙත ඉදිරිපත් කරනු ලබන අවසාන වාර්තාව තුළ ව්‍යාපෘති යෝජනාව ඇතුලත් කළ යුතුය.ව්‍යාපෘති යෝජනාව තුළ අඩංගු විය යුතු කරුණු වලට අමතරව,අවසාන වාර්තාව තුළ පහත සඳහන් දේ ඇතුලත් විය යුතුය.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ආකාරය , මුහුණ දුන් ගැටළු හා බාලදක්ෂයා විසින් ඒවා විසඳා ගත් ආකාරය, දින සැලසුම්,ඡායාරූප,දත්ත , රූප සටහන්,පුවත් පත් උපුටන ආදී අවශ්‍ය කරුණු ලිඛිත වාර්තාව තුළ අඩංගු විය යුතුය.

### වාර්තාව තුළ අඩංගු විය යුතු කරුණු

1. අවශ්‍ය සම්පත් හා ඒවා ලබාගත් අයුරු.
2. සහභාගී වූ අයගේ නම්.
3. මිනිස් පැය ගණන, ආහාර හා විවේකයට ගත වූ කාලය (මිනිස් පැය 72ක් උපරිම බාලදක්ෂයින් 12 දෙනෙකු විසින් සම්පූර්ණ කළ යුතුය.
4. ආහාර ආදිය ලබාගත් ක්‍රමය.
5. මේ සඳහා ලබා දුන් ප්‍රචාරය.
6. අවසාන ය වැය.
7. ආයතන ප්‍රධානියාගෙන් ව්‍යාපෘතිය සාර්ථකව ඉටු කළ බවට ලිපිය.
8. ව්‍යාපෘතිය පිළිබඳව ඇගයීම.
9. බාලදක්ෂ නායකගේ නිර්දේශය.
10. දිසා කොමසාරිස් / සහකාර දිසා කොමසාරිස් ගේ නිර්දේශය.